2nd International Conference of Multidisciplinary Approaches (iCMA), 2015
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka

ISSN: 2386 – 1509
Copyright © iCMA


# *දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ බෞද්ධ අදාළත්වය*

**ආර්. පී. දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**

*පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයල කැලණිය විශ්වවිද්‍යාලය*

දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ බෞද්ධ අදාළත්වය" නම් මෙම පර්යේෂණයේ මූලික උපන්‍යාසය වන්නේ දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ බෞද්ධ අදාළත්වය අතිශය සාධනීය, සදාචාරවත් හා ක්‍රියාකාරී මට්ටමක පවත්නා ප්‍රායෝගික පිළිවෙතක් බව පෙන්වා දීම යි. එමෙන් ම මෙම පිළිවෙතෙහි න්‍යාත්මක හා ප්‍රායෝගික අංශ තවදුරටත් අධ්‍යනය කිරීමෙහි උපයෝගීතාව ද මතු කිරීම යි. බෞද්ධ ආර්ථික චින්තනයෙහි දූරදර්ශී, තිරසාරාත්මක පදනමක් අන්තර්ගත වන අතර එය උභයාර්ථ සාධනයෙහි ම පවතින්නක් බව මෙමගින් විශද වන මූලික කරුණකි. දරිද්‍රතාව විෂයෙහි බෞද්ධ ආකල්පය ගැඹුරින් විමසා බලන විට එහි විෂයෙහි අසමාජීයත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් වන විචාරවල පදනම් විරහිතභාවය නිසර්ගයෙන් ම මතු වන අතර සමාජ ගැටලු විෂයෙහි බෞද්ධ එළඹුම ස්වල්ප කොට සැලකීම සාධාරණ නොවන බව ද මෙමගින් පිළිඹිබු වේ. මෙම පර්යේෂණය මූලික වශයෙන් ම මූලාශ්‍ර අධ්‍යයනයක් වන අතර ත්‍රිපිටකයත් ඒ සම්බන්ධ අටුවා ආදී සාහිත්‍ය පදනම් කරගත් ප්‍රාථමික මූලාශ්‍රත් මෙම මාතෘකාවට අදාළ මෑත කාලීනව රචනා වී ඇති ග්‍රන්ථ, ලිපි ආදී ද්විතීයික මූලාශ්‍රත් ආශ්‍රය කර ගැනේ.

දිළිදුකම හෙවත් දුප්පත්කම සමාජ සන්දර්භය අතින් සාපේක්ෂක වූ ද පුද්ගල දෘෂ්ටිකවූ ද සංකල්පයකි. එය නිර්වචනය කිරීම සඳහා භෞතික, සංස්කෘතික ආදි විවිධමාන භාවිත කර ඇතිඅතරසමාජභාමානවවිද්‍යාඥයන් මේ පිළිබඳව දක්වන නිර්වචනාත්මක පදනමට සමාජ, සංස්කෘතික හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ කරුණු කෙරේ ද අවධානය යොමු වී ඇත. සමස්තයක් ලෙෂ මෙමගින් සමාජ, ආර්ථික දේශපාලනිකහාපාරිසරිකවශයෙන්විවිධ අර්බුදවලට මුහුණ දීමට සිදුවන හෙයින් කවර සමාජයකවත් කුමන සන්දර්භයකින්වත් දරිද්‍රතාවය ක්‍රියාත්මක වනු දැකීම අනුමත නොකරනු ඇත. බුදුදහමට අනුව දරිද්‍රතාවවනාහී ලෞකික සහ ආධ්‍යාත්මික අරමුණු සාක්ෂාත්කර ගැනීමෙහිලා බාධාවකි. එය විරාගය පිණිස නොපවතියි.

දරිද්‍රතාව සහ විරාගය අතර කවරාකාරයේ සම්බන්ධයක් බුදුදහමින් ප්‍රකටවන්නේදැ'යි යන්න පිළිබඳ විවාදයක 'විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්‍යාර්ථීන් අතර පවත්නා බව පෙනේ. අති-වාමපාක්ෂික දේශපාලකයන්ගේ මතයට අනුව බුදුදහම තුළින් දිළිඳුභාවය සාධාරණීකරණය වේ. කෙසේ නමුත් දරිද්‍රතාව විෂයෙහි බෞද්ධ විග්‍රහ කෙරේ ගැඹුරු අධ්‍යයනයක් එබඳු විවේචන තුළින් දැකගත නොහැක. දරිද්‍රතාව ප්‍රතික්ෂේප කරන බුදුසමයධනයේ උපයෝගීතාව අවධාරණය කරන්නේ දුප්පත්කම කාමභෝගී ගිහියනට දුකක් වන බව ද අවධාරණය කරමිනි. දුප්පත්කම නිසා සමාජගත අර්බුද මතු වීම හා පුද්ගලයාට විවිධ අර්බුද මුහුණපාන්නට සිදුවීම යනුවෙන් බුදුදහම දුප්පත්කමේ ආදීනව ආකාර දෙකකින් ඉදිරිපත් කරයි. සමාජ ප්‍රගතියවිෂයෙහි දරිද්‍රතාව තුළින් පිළිඹිබු කෙරෙන ඍණාත්මක පදනමට ප්‍රතිපක්ෂව ඉදිරිපත් කරන පිළියම් රැසක් බෞද්ධසූත්‍ර දේශනාවල අන්තර්ගත වේ. දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ දී දරිද්‍රතාවය තුරන් කිරීමේ අභිලාෂයෙන් ජනතාවගෙන් උපයාගත් ජාතික භාණ්ඩාගාරය ජනතාවගේ ම සමෘද්ධිය පිණිස යෙදවීමට රාජ්‍යයේ පාලකයන් කටයුතු කළයුතු ආකාරය පෙන්වා දෙන අතර එහිදී පාලකයන් රාජ්‍යයේ කෘෂිකාර්මික, කාර්මික, වාණිජ, රාජ්‍ය සේවය යනා දී අංශ කෙරේ පමණක් නොවසැලකිල්ලට බඳුන් විය යුතු ස්වකීයිය ශක්තියෙන් නැගීසිටීමට නොහැකි පිරිස් කෙරේ ද අවධානය යොමු කළයුතු බව පෙන්වා දෙයි.

දරිද්‍රතාවට ප්‍රතිපක්ෂව පෞද්ගලික දායකත්වය ද අවධාරණය කරන බුදුසමය ස්වකීය ශක්තියෙන් ධාර්මිකව, මධ්‍යස්ථව හා සදාචාරීව වෙරවීරිය ඇතිව කටයුතු කළයුතු අයුරුත් උපයා සපයා ගත් ධනය බුද්ධිමත්ව හා ආරක්ෂාකාරීව පරිභෝජනය, ආයෝජනය ඉතිරි කළයුතු අයුරුත් පෙන්වා දී ඇත.

ප්‍රමුඛ පද - දරිද්‍රතාවය, සංවර්ධනය, බුදුසමය, උභයාර්ථ සාධනය, ආර්ථිකය